# ආයුබෝවන්

# බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජ පරිවර්තනය

එන් .එස් ලියනගේ
හ/රන්න වාඩියගොඩ ක. වි

1815 දී බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් වූ ලංකාව දිගු කලක් සිට විකාශණය වෙමින් පැවත ආ මෙරට පාලන ක්‍රමය, සමාජ ආර්ථික ක්‍රමය හා සංස්කෘතිය ප්‍රබලව වෙනස්කම් රැසකට මුහුණ දෙමින් පැවත එනු ලැබින

මෙම පාඩම ඇසුරින් අපේ ලංකාව යටත් විජිත කාලවකවානුව තුළ සමාජ,ආර්ථික හා සංස්කෘතික අංශයන්හි ඇති වූ වෙනස්කම් පිළිබඳව සාකච්ඡා කෙරේ.

# බටහිර ජාතීන් පැමිණීමට පෙර අපේ රටේ පැවති සමාජ ආර්ථික ක්‍රමය

- ලංකාවේ සාම්ප්‍රදායික ආර්ථික හා සමාජ ක්‍රමයකට හා සංස්කෘතියට පදනම සකස් වූයේ අනුරාධපුර යුගයේ සිටයි

- දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ සිට බුදු දහමේ අභාසය මත ගොඩනැගුණු සමාජ ආර්ථික රටාවක් මෙරට ක්‍රියාත්මක විය

- එම ආර්ථික රටාවේ වෙනස්වීම් සිදු වුයේ 16 වන සියවසේ පෘතුගීසීන්ගේ ආගමනයත් සමග සිදුවිය

# බටහිර ජාතීන් පැමිණීමට පෙර ලංකාවේ ආර්ථික රටාව

- කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වීම
- වැටුපට වැඩ කරන පිරිසක් දක්නට නොලැබීම
- අත්තම් ක්‍රමය යටතේ වැඩ කිරීම නිසා මුදල් භාවිතය අවම වීම
- ගම් සභාවට ප්‍රධාන තැනක් වීම
- රාජකාරී ශ්‍රම ක්‍රමය







# ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය
















# අත්තම් ක්‍රමය







ගම් වැසියන්ගේ සුළු ආරවුල් විසඳීම
ගමේ ඇළ වේළි සැකසීම
ගම් සභාව
වැව් අමුණු නඩත්තු කිරීම
පාරවල් හා වෙහෙර විහාර තැනවීම

# රාජකාරී ශ්‍රම ක්‍රමය

## ඉඩම් භුක්ති රාජකාරී ක්‍රමය -

අතීතයේ රජුට අවශ්‍ය සේවා සපයන නිළධාරීන්ට යැපීම සඳහා ඉඩකඩම් ලබා දී තිබුණි එම ඉඩ කඩම් වගා කරනු ලැබුවේ සාමාන්‍ය ජනතාවයි ඔවුන්ට ඉඩම් වගා කිරීම වෙනුවෙන් සේවය සැපයීම ඉඩම් භුක්ති රාජකාරී ක්‍රමය නම් වේ

- අනිවාර්යය සේවා රාජකාරී ක්‍රමය

රටේ වැඩිහිටි පිරිමි සියලු දෙනා ම වසරකට නියමිත දින ගණනක් කිසිදු ගෙවීමක් නොකොට රජුට අවශ්‍ය ශ්‍රමය නොමිලේ සැපයීම අනිවාර්යය සේවා රාජකාරී ක්‍රමය නම් වේ










# බ්‍රිතාන්‍යයන් යටතේ ආර්ථික වෙනස්වීම්

## කෝල්බෲක් කොමිසමේ ආර්ථික ප්‍රතිසංස්කරණ

- පෞද්ගලික ආයෝජකයන්ට ධනය ආයෝජනය කළ හැකි පසුබිමක් ගොඩනැගීම
- රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය
- මෙරට සිවිල් නිළධාරීන්ට පවා වතු වගා කිරීමට අවසර ලබා දීම
- අනිවාර්යාය සේවා රාජකාරී ක්‍රමය අහෝසි කරමින් වැටුපට වැඩ කරන ශ්‍රමිකයන් පිරිසක් ඇති වීම
- රජයේ වෙළඳ ඒකාධිකාරිය අහෝසි කිරීම(කුරුඳු හා ලුණු)
- ද්‍රව්‍ය වලින් බදු ගෙවීට වෙනුවට මුදල් වලින් බදු ගෙවීමේ ක්‍රමයක් හඳුන්වා දීම
- බැංකු ක්‍රමය ආරම්භ වීම

# වතු වගාවේ දියුණුව



# කෝපි වගාව

- ලන්දේසි යුගයේ ආරම්භ වූ කෝපි වගාව දියුණුවට පත් වූයේ ඉංග්‍රීසි යුගයේ යි
- මුල්ම කෝපි වගාව ජෝර්ජ් බර්ඩ් විසින් ගම්පොළ සිංහපිටියෙන් ආරම්භ කිරීම







# කෝපි වගාව දියුණු වීමට බලපෑ හේතු කිහිපයක්

- ✓ 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලින් පසුව විදේශිකයන් වැඩි වැඩියෙන් කෝපි වගාවට ධනය ආයෝජනය කිරීම
- ✓ යුරෝපා වෙළඳපොළේ කෝපිවලට ඇති ඉල්ලුම ඉහළ යාම
- ✓ කෝපි වගාවෙන් විශාල වශයෙන් ලාභ ලැබිය හැකි වීම
- ✓ ඉන්දියානු ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම නිසා වතු වගාවට ලාභදායි ලෙස ශ්‍රමය ලබා ගත හැකි වීම





- 1837 -1847 කෝපි වගාව වේගයෙන් පැතිරුණු අතර 1845 වන විට වතු 500 පැවති බව වාර්ථා වේ

- දුම්බර මිටියාවත, ගම්පොළ, පේරාදෙණිය, මාතලේ ,බදුල්ල හා මධ්‍යම පළාතේ බොහෝ ප්‍රදේශවල සාර්ථකව කෝපි වගාව සිදු වීම

- 1848 වන විට ලෝක ආර්ථික පරිහානිය තුළ කෝපි වගාව පහල ගිය ද 1850 වන විට නැවත එය යථා තත්තවයට පත් විය

- 1869 දී ඇති වූ කෝපි කොළ රෝගයක් නිසා (හෙමීලියා වෙස්ටර්ට්‍රික්ස්) කෝපි වගාව ශ්‍රීඝයෙන් පරිහානියට පත් වීම

# සිංකෝනා වගාව

- කෝපි වගාවට විකල්ප වගාවක් වශයෙන් සිංකෝනා වගාව හඳුන්වා දෙන ලදී
- සිංකෝනා යනු ක්විනින් නැමති ඖෂධය නිපදවීමට යොදාගත් බෙහෙත් පැළෑටියක් වූ නිසා ඒ සඳහා ඉල්ලුම සීමිත වීම හා සිංකෝනා වගාව සාර්ථක නොවීය



# කොකෝවා වගාව

- ✓ කොකෝවා වගාවට සෙවන අවශ්‍ය වූ නිසා අමතරව වියදමක් දැරීමට සිදුවීම
- ✓ මෙම වගාව සාර්ථකව සිදු කළ හැක්කේ මාතලේ දිස්ත්‍රික්කයේ පමණක් වීම




# තේ වගාව

- 1867 වර්ෂයේ දී වැවිලිකරුවන්ගේ සංගමය වතුකරුවන් පිරිසක් ඇසෑමයට යවා තේ වගාව ගැන වැඩිදුර හැදීරීමක් සිදු කරවීම
- ජේම්ස් ටේලර් විසින් ලූල්කදුර වතුයායේ අක්කර කිහිපයක තේ වගා කරමින් අත්හදාබැලීමක් සිදු කිරීම





- 1894 වර්ෂය පමණ වන විට මෙරට තේ වගා බිම් ප්‍රමාණය අක්කර ලක්ෂ 04 ක් දක්වා වැඩි වීම
- වියළි කලාපය හැරුණු විට අඩි 6000 ක් දක්වා උස ඕනෑම ප්‍රදේශයක තේ වගා කළ හැකි වීම
- මධ්‍යම ඌව හා සබරගමු පළාත් තුළ මෙම තේ වගාව ව්‍යාප්ත වීම
- 1930 පමණ වන විට මධ්‍යම හා විශාල ප්‍රමාණයේ තේ වතු 1200 ක් පමණ මෙරට තිබී ඇත
- 1929 දී ලෝක ආර්ථික අර්බුදය හමුවේ තේ වලින් ලැබෙන ආදායම අඩු වුවත් පසුව එය යථා තත්තවයට පත් වීම






# තේ වගාවේ උන්නතියට බලපෑ හේතු


- ලංකාවේ තේ වගාව සඳහා වෙළදපොළේ හොද ඉල්ලුමක් පැවතීම
- වියළි කලාපය හැර සෙසු ප්‍රදේශ බොහොමයක තේ වගාවට උචිත පරිසරයක් පැවතීම
- නවීන කර්මාන්තශාලා හා යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් ගුණාත්මක භාවයෙන් ඉහළ තේ නිපදවීමට මෙරට සමත් වීම
- මාර්ග පහසුකම් දියුණු වීම නිසා ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු වීම
- දකුණු ඉන්දියානු කම්කරුවන් ගෙන ඒම නිසා ලාබදායි ශ්‍රමය ලබා ගත හැකි වීම

- මාර්ග පහසුකම් දියුණු වීම හරහා ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු වීම





# ➢ තලවකැලේ තේ පර්යේෂණ ආයතනය පිහිටා තිබීම




# පොල් වගාව

- පොල් වගාව යනු අතීත කාලයේ සිට මෙරට පැවති ගෙවතු වගාවකි
- 1850 දී කෝපි මිල ඉහල යාම නිසා පොල් වගාව පිළිබඳ උනන්දු වීම
- කුරුණෑගල හලාවත හා ගම්පහ වැනි ප්‍රදේශවල පොල් වගාව වැඩි වශයෙන් ව්‍යාප්ත විය
- ස්වදේශිකයන් වැඩි වශයෙන් පොල් වගාවේ නියැළුණි
- 1880 වන විට පොල් වතු හිමියන්ගේ 65% ක් ලාංකිකයන් විය.

- 1920 වන විට මෙරට මෙරට විදේශීය විනිමය ඉපයීම්වලින් 27% ක් පමණ පොල් වලින් උපයා ගන්නා ලදී
- පොල් පර්යේෂණ ආයතනය ලුණුවිල පිහිටා ඇත.







පොල් වගාව
පොල් වගා කරන ප්‍රදේශ
පොල් පර්යේෂණ ආයතන
යාපනය
කිලිනොච්චිය
මුලතිව්
වව්නියාව
මන්නාරම
ත්‍රිකුණාමලය
අනුරාධපුරය
පොළොන්නරුව
පුත්තලම
මඩකලපුව
කුරුණෑගල
මාතලේ
මහනුවර
අම්පාර
කෑගල්ල
ගම්පහ
බදුල්ල
නුවර එළිය
කොළඹ
මොණරාගල
රත්නපුර
කළුතර
ගාල්ල
හම්බන්තොට
මාතර
10 0 10 20 30 40 50
80°00'
80°30'
81°00'
81°30'
82°00'

# රබර් වගාව

- ✓ 1877 වර්ෂයේ දී මෙරටට තේ වගාව හඳුන්වා දුන්නත් වැවිලි කරුවන් තේ වගාවට යොමු වීම නිසා රබර් වගාව වේගයෙන් ව්‍යාප්ත නොවීම
- ✓ රබර් වගාව දියුණු වූයේ 20 වන සියවසේ මෝටර් රථ කර්මාන්තයේ දියුණුවත් සමගයි
- ✓ මුල් කාලයේ දී කාලයේ දී කළුතර දිස්ත්‍රික්කයට පමණක් සීමා වූ රබර් වගාව පසවු බස්නාහිර, සබරගමුව, දකුණ යන පළාත්වල හා මධ්‍යම පළාතේ ඇතැම් ප්‍රදේශවලත් පැතිරීණි


රබර් වගාව
ව්‍යාප්ත ප්‍රදේශ
රබර් වගා කරන ප්‍රදේශ
රබර් පර්යේෂණ ආයතනය
යාපනය
කිලිනොච්චිය
මුලතිව්
මන්නාරම
වව්නියාව
ත්‍රිකුණාමලය
අනුරාධපුරය
පොළොන්නරුව
පුත්තලම
මඩකලපුව
කුරුණෑගල
මාතලේ
මහනුවර
අම්පාර
කෑගල්ල
ගම්පහ
නුවර එළිය
බදුල්ල
මොණරාගල
කොළඹ
කළුතර
රත්නපුර
අගලවත්ත
හම්බන්තොට
ගාල්ල
මාතර
9°30'
9°00'
8°30'
8°
80°30'
81°00'
81°30'
82°00'

✓ රබර් පර්යේෂණාගාරය අගලවත්තේ පිහිටා ඇත









# සමාජ වෙනස්වීම්

- ✓ පැරණි ප්‍රභූ පන්තිය අභාවයට ගොස් නව මධ්‍යම පන්තියක් බිහිවීම
- ✓ පැරණි ප්‍රභූ පන්තිය යනු -

ආර්ථික තත්වය හා දේශපාලන බලය අතින් සෙසු ජනතාවට වඩා විශේෂයෙන් කැපී පෙනුණු සැලිකිය යුතු ඉඩම් හිමිකමක් තිබෙන තිබූ ඔවුහු ඉහළ ආදායමක් තිබූ අතර පවත්නා පාලනයට පක්ෂපාතීව කටයුතු කිරීමෙන් රජයේ නිල තල දැරූ පිරිසක් ද වූහ



- කෝබෲක් ප්‍රතිසංස්කරණ යටතේ ධනය උපයාගත හැකි මාර්ග රැසක් නිර්මාණය විය
- මේ මගින් දේශීයව ධනය උපයා ගන්නා ලද ධනවතුන් රාශියක් බිහි විය
- මොවුන් ඔවුන්ගේ දරුවන් ට දේශීය හා විදේශීය අධ්‍යාපනය ලබා දෙමින් උසස් රැකියාවල යොදනු ලැබීය
- මේ ආකාරයෙන් ධනය උපයාගත් ව්‍යාපාරිකයන් හා ඉංග්‍රීසි උගත් රජයේ තනතුරු දරන පිරිස මධ්‍යම පාන්තිකයන් විය
- මෙම මධ්‍යම පාන්තිකයන් උගත්තු දේශපාලන වශයෙන් ද ක්‍රියා කාරී කොටසක් බවට පත් වූහ
- දේශපාලන උද්ඝෝෂණවලද පෙරමුණ ගෙන කටයුතු කරන ලදී



# කම්කරු පන්තියක් බිහිවීම

- ✓ බ්‍රිතාන්‍ය පාලනය තුළ අපේ රටේ ඇති වූ ආර්ථික වෙනස්කම් මෙරට කම්කරු පන්තියක් බිහිවීමට හේතු විය
- ✓ වතු වගාවට අවශ්‍ය ශ්‍රමිකයන් අවම වැටුපකට දකුණු ඉන්දියාවෙන් ගෙන ඒමත් සමග මෙරට කම්කරු ජනතාවක් බිහිවිය
- ✓ නගර ආශ්‍රිතව නව රැකියා උත්පාදනය වීමත් සමග ස්වදේශීයව කම්කරු පිරිසක් බිහිවීම

ගාල්ල මාතර කොළඹ මහනුවර වැනි නගර ආශ්‍රිතව බඩු බෑම බඩු පැටවීම රෙදි සේදීම කරත්ත මගින් භාණ්ඩ ප්‍රවාහනය මංමාවත් හා දුම්රිය මාර්ග තැනවීම





**කම්කරු සුභසාධන කටයුතු වෙනුවෙන් වෘත්තීය සංගම් බිහිවීම හා වැඩ වර්ජන පැවැත්වීම**

- මුද්‍රණ කම්කරු වැඩවර්ජනය
- කොළඹ රෙදි සෝදන්නන්ගේ වැඩවර්ජනය
- කරත්තකරුවන්ගේ වැඩවර්ජනය


GOVT. CLERICAL SERVICE UNIO







# 1922 දී ඒ ඊ ගුණසිංහ මහතා විසින් ලංකා කම්කරු සංගමය පිහිටුවීම



ඒ.ඊ. ගුණසිංහ



කොල්වින් ආර්. ද සිල්වා

# සංස්කෘතික වෙනස්වීම්

- ✓ කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලින් පසුව අප රටට හඳුන්වාදෙන ලද බටහිර අධ්‍යාපනය ව්‍යාප්ත වීමත් සමග මිෂනාරී පාසල් හරහා අප රටට බටහිර සංස්කෘතිය ව්‍යාප්ත වීම
- ✓ අධ්‍යාපන කටයුතු සඳහා විදේශගත වූ අපේ රටේ පුද්ගලයින් හරහා ද අප රටට බටහිර සංස්කෘතියේ අංග එකතු වීම
- ✓ 19 වන සියවසේ දී අපේ රටේ වතු වගාවේ ආරම්භයත් සමග

වෙළඳාම දියුණු වීම

ගමනාගමන කටයුතු වල හා සන්නිවේදනයේ දියුණුව සිදු වීම

# අපේ රටට එකතු වූ බටහිර අංග

**බටහිර ඇඳුම් පැළඳුම් -**







# සිරිත් විරිත් ආචාර සමාචාර ක්‍රම හා ගෘහ නිර්මාණ







# නිවාඩු නිකේතන හා සමාජශාලා







# බ්‍රිතාන්‍ය පාලනය නිසා උරුම වූ ප්‍රයෝජනවත් අංග

- ජාත්‍යන්තර භාෂාවක් වන ඉංග්‍රීසි භාෂා දැනුම රට තුළ පැතිරීම
- ගමනාගමන කටයුතු හා සන්නිවේදන කටයුතු දියුණු වීම








- ✓ අපනයන වැවිලි භෝග ශද්නවා දීම
- ✓ කාර්මික විප්ලවයේ බලපෑම මෙරටට ලැබීම
- ✓ පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය












# බ්‍රිතාන්‍ය පාලනයේ අහිතකර බලපෑම්

- ✓ බටහිර සංස්කෘතියේ අංග රට තුළ පැතිරීම හා සාම්ප්‍රදායික සංස්කෘතික ලක්ෂණවල යම් පිරිහීමක් ඇති වීම







- මධ්‍යසාර භාවිතය රට පුරා ව්‍යාප්ත වීම
- ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම
- සාම්ප්‍රධායික ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය බිඳ වැටීම හා දේශීය දැනුම බොහෝ සෙයින් අභාවයට යාම
- ගම් සභා වැනි ප්‍රයෝජනවත් ආයතන විනාශ වීම



# ස්තූතියි

